සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - **I, II** | කාලය පැය 03 යි. |
|---|---|---|

නම / විභාග අංකය: ..............................................................................

# පුරවැසි අධ්‍යාපනය - I

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. රාජ්‍යය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමත්, පුරවැසියන් පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙහෙයවීමත් සිදුකරනු ලබන්නේ,

(1) රාජ්‍යය විසිනි (2) ආණ්ඩුව විසිනි
(3) ජනතාව විසිනි (4) සමාජය විසිනි

02. එක් මධ්‍යම ආණ්ඩුවක් යටතේ බලය ඒකරාශී වූ රාජ්‍යයන් හැඳින්වෙන්නේ කෙසේද?

(1) ඒකීය රාජ්‍ය (2) ජනතා රාජ්‍යය (3) සන්ධීය රාජ්‍යය (4) ජාතික රාජ්‍යය

03. ග්‍රීක පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය හැඳින්වූයේ කවර නමකින් ද?

(1) නියෝජන සභාව (2) උත්තර සභාව
(3) පුරවැසි සභාව (4) පාලන සභාව

04. මහජන නියෝජිතයන් මගින් රටක පාලන කටයුතු මෙහෙයවීම,

(1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය යි (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යි
(3) පුරවැසි ප්‍රජාතන්ත්‍රවාදය යි (4) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය යි

05. සන්ධීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටක් වන්නේ මින් කවරක්ද?

(1) මහා බ්‍රිතාන්‍යය (2) ප්‍රංශය (3) ශ්‍රී ලංකාව (4) ඔස්ට්‍රේලියාව

06. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයකින් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීමෙන් සිදු වන්නේ,

(1) බලය මධ්‍යගත කිරීම ය (2) බලය බෙදා හැරීම ය
(3) බලය විසුරුවා හැරීම ය (4) බලය විමධ්‍යගත කිරීම ය

07. ස්විස්ටර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(1) කැන්ටන් (2) ප්‍රාන්ත (3) කොංග්‍රසය (4) සභාව

08. ජන සමාජයක ''සංස්කෘතිය'' යන්නෙහි අදහස දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) විවිධ ජන වර්ග එකට ජීවත් වීම
(2) ආගමික විශ්වාස අනුව ඇදහිලි අනුගමනය කිරීම
(3) සමාජය තුළ විවිධ සිරිත් විරිත් පද්ධතියක් පැවතීම
(4) සමාජය තුළ පිළිගත් ජීවන රටාවකට අනුව හැඩගැසීම

09. භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩිපුර යන්ත්‍ර සූත්‍ර භාවිත කරන්නේ නම්, ඒ සඳහා භාවිත කර ඇත්තේ කවර ශිල්පීය ක්‍රමය ද?

(1) ශ්‍රම සූක්ෂම (2) ශ්‍රම විභජන

(3) ප්‍රාග්ධන සූක්ෂම (4) නිෂ්පාදන සූක්ෂම

10. ගැටුම් විසඳීම සඳහා බේරුම්කරණය යොදාගත හැකි අවස්ථාවක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) පවුල් ආරවුල් (2) ජාතීන් අතර පවතින ගැටුම්

(3) මුදල් පිළිබඳ ගැටුම් (4) සම වයස් කණ්ඩායම් අතර ගැටුම්

11. ගෝලීයකරණය නිසා සංවර්ධනය වන රටවලට මුහුණපෑමට සිදු විය හැකි අයහපත් ලක්ෂණයක් වන්නේ,

(1) යටත් විජිත වාදයට ලක්විය හැකි වීම ය

(2) අඩු මිලකට ශ්‍රමය ලබා දිය හැකි වීම ය

(3) ඕනෑම රටක ජීවත් විය හැකි වීම ය

(4) විදේශ තාක්ෂණය භාවිත කළ හැකි වීම ය

12. පුද්ගලයාගේ අවශ්‍යතා හා වුවමනා ඍජුව ඉටු කර ගැනීම සඳහා භාවිත කරනුයේ,

(1) අන්තර් භාණ්ඩ ය (2) පාරිභෝජන භාණ්ඩ ය

(3) කෘෂිකාර්මික භාණ්ඩය (4) කාර්මික භාණ්ඩ ය

13. යහ පාලනයක් සඳහා එකිනෙකාගේ සංස්කෘතික අනන්‍යතාවයට ගරු කිරීමේ වැදගත්කම දැක්වෙන්නේ මින් කවර පිළිතුරෙහි ද?

(1) විවිධ භාෂාවන් ඉගෙනීම හා භාවිතය

(2) නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම

(3) යටිතල පහසුකම් සංවර්ධනය

(4) වෘත්තීය සමිති පිහිටුවා ගැනීම

14. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය මූලික දේවල් හැඳින්වෙන්නේ,

(1) වුවමනා ලෙස ය (2) භාණ්ඩ ලෙස ය

(3) සේවා ලෙස ය (4) අවශ්‍යතා ලෙස ය

15. ජොහාන් ගැල්ටුන් ඉදිරිපත් කළ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ ''සන්දර්භය'' යනුවෙන් අදහස් කරන ලද්දේ,

(1) ගැටුමට පසුබිම් වන තත්වය යි (2) මනෝ විද්‍යාත්මක සාධක යි

(3) බලහත්කාරී චර්යාව යි (4) පාර්ශව කරුවන් තුළ ඇති අවබෝධය යි

16. නගර සභාවක ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන්නේ,

(1) ප්‍රධාන අමාත්‍යතුමා ය (2) නගරාධිපතිතුමා ය

(3) ආණ්ඩුකාරතුමා ය (4) නාගරික කොමසාරිස්තුමා ය

17. පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A පළාත් අයවැය ලේඛනය සැකසීම

B පළාත් සභා ප්‍රඥප්තීන් අනුමත කිරීම

C පළාත් සභාව කැඳවීම හා වාර අවසාන කිරීම

D වරදකරුවන්ට සමාව දීම

මේ අතුරින් පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතල දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා C (3) A හා C (4) B හා D

18. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

(1) විධායකය (2) ව්‍යවස්ථාදායකය

(3) ආණ්ඩුව (4) අධිකරණය

19. පළාත් සභාව හා මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,

(1) පළාත් මන්ත්‍රීවරයා ය (2) පළාත් ආණ්ඩුකාරවරයා ය

(3) පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ය (4) කථානායකවරයා ය

20. වර්තමානයේ ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රාන්ත ආණ්ඩු ඉක්මවමින් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ ප්‍රවණතාවක් ඇති වීම කෙරෙහි බලපා ඇති හේතුවක් වන්නේ,

(1) ප්‍රාන්ත ආණ්ඩු පනහකින් යුතුවීම ය

(2) සමාජ ආර්ථික ගැටලු වල සරල ස්වභාවය ය

(3) ෆෙඩරල් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වීම ය

(4) මූල්‍යමය වශයෙන් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීම ය

21. පුරවැසියන්ගේ බාහිර චර්යාව පාලනය කිරීම සඳහා රජය විසින් පනවනු ලබන රීති සමූහය හැඳින්වෙන්නේ කෙසේද?

(1) ආචාර ධර්ම (2) චිරිත් (3) සම්ප්‍රදාය (4) නීති

22. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වීම

(2) විධායක ජනාධිපති විසින් විධායක බලය හැසිරවීම

(3) රාජ්‍යයේ හා ආණ්ඩුවේ නායකයා ජනාධිපති වීම

(4) විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට නොහැකි වීම

23. ජාතික රාජ්‍යයන් ප්‍රබල ලෙස නැගී සිටීමට බලපෑ හේතුවක් වන්නේ,

(1) වැඩ වසම් ආර්ථිකය (2) යුධ හා නාවික ශක්තිය

(3) ආගමික ප්‍රතිසංස්කරණ (4) වාර්ගික විවිධත්වය

24. තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණක් නොවන්නේ,

(1) ස්වභාවික සම්පත් සංරක්ෂණය (2) සමාජ සුරක්ෂිතභාවය

(3) පෞද්ගලික දේපල අයිතියට ඉඩදීම (4) පරිසරය ආරක්ෂා කර ගැනීම

25. වෙළඳපොළ ආර්ථිකයක් තුළ දැකිය හැකි අහිතකර ලක්ෂණයක් වන්නේ,

(1) සෘණ බාහිරතා නොසැලකීම (2) ගෝලීය වෙළඳපොළ පුළුල් වීම

(3) ශ්‍රම හා ප්‍රාග්ධන සංචලතා (4) සහනාධාර හා මිලපාලන ක්‍රම ලිහිල් කිරීම

26. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන නිර්ණායක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) ආණ්ඩුව හා භූමිය (2) ජනගහනය හා දිස්ත්‍රික්ක

(3) දිස්ත්‍රික්ක හා පළාත් (4) භූමිය හා ජනගහනය

27. රටක සියල්ලන්ටම ඉහළින් නීතිය පැවතීම හැඳින්වෙන්නේ,

(1) පරමාධිපත්‍ය බලය යනුවෙනි (2) නීතියේ ආධිපත්‍යය යනුවෙනි

(3) ආධිපත්‍යය බලය යනුවෙනි (4) නීත්‍යානුකූල බලය යනුවෙනි

28. නිෂ්පාදනය සඳහා මිනිසා විසින් ආයෝජනය කරන විවිධ මෙවලම් හා උපකරණ සඳහා කරන ගෙවීම,

(1) බදු කුලිය යි (2) ලාභය යි (3) ප්‍රාග්ධනය යි (4) පොලිය යි

29. සමාජවාදී වෙළඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන රටක් වන්නේ,

(1) ජෝර්ජියාව (2) දකුණු කොරියාව (3) කියුබාව (4) ඔස්ට්‍රේලියාව

30. ආර්ථික ප්‍රශ්න නිසා පවුල තුළ ඇතිවන ගැටුම් අයත් වන්නේ මින් කවර ගැටුම් වර්ගයට ද?

(1) සූක්ෂම ගැටුම් (2) යුධමය ගැටුම් (3) සාර්ව ගැටුම් (4) ජාතික ගැටුම්

31. බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන්,

(1) ජන වර්ග අතර විශ්වාසය තහවුරු වේ (2) නීත්‍යානුකූල රැකියා වල නිරත විය හැකි වේ

(3) දේශපාලන ස්ථාවරත්වය තහවුරු වේ

(4) සමාජානුයෝජනයට පසු බිම සකස් කරගත හැකි වේ

32. ගැටුමක් නිර්මාණය වීම සඳහා මූලික වශයෙන් හේතු පාදක වන්නේ,

(1) පුද්ගලයා තුළ ඇති වන අවිශ්වාසය වේ

(2) පුද්ගලයා තුළ ඇති වන නොරිස්සුම හා මතභේදය යි

(3) පුද්ගලයා තුළ පවතින ආගමික මතවාදය යි

(4) පුද්ගලයා තුළ පවතින දේශපාලන මත භේදය යි

33. නිෂ්පාදනයේ දී පිරිවැයක් දැරීමටත් පරිභරණය සඳහා මිලක් ගෙවීමටත් සිදුවන භාණ්ඩ හැඳින්වෙන්නේ කවර නමකින් ද?

(1) නොමිළ භාණ්ඩ (2) ආර්ථික භාණ්ඩ

(3) සුබෝපභෝගී භාණ්ඩ (4) කාර්මික භාණ්ඩ

34. දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම (SAPTA) පිහිටුවා ගැනීමේ අරමුණ වන්නේ,

(1) මූල්‍ය ගනුදෙනු වඩාත් ක්‍රමවත් කිරීම යි (2) තාක්ෂණික හුවමාරුව ඇති කර ගැනීම යි

(3) කලාපීය සහයෝගීතාව ඇති කිරීම යි (4) කලාපීය වෙළඳාම පුළුල් කිරීම යි

35. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීම කෙරෙහි බලපෑ භූගෝලීය සාධකයක් වන්නේ,

(1) දිවයින වටා පිහිටි වරායයන් ය (2) දකුණු ආසියාවට අයත් වීම ය

(3) ආසියා මහද්වීපයේ පිහිටීම ය (4) ඉන්දියන් සාගරය මධ්‍යයේ පිහිටීම ය

36. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ,

(1) නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම ය (2) රට ඡන්ද කොට්ඨාසවලට බෙදීම ය

(3) පක්ෂපාති ජනමාධ්‍ය පැවතීමය (4) නීතියේ රැකවරණය සැමට ලබා දීම ය

37. රටක සමාජ සාධාරණත්වය ගොඩනැගීම බිඳවැටීම කෙරෙහි බලපා ඇති හේතුවක් වන්නේ,

(1) වංචාවෙන් හා දූෂණයෙන් තොරව කටයුතු කිරීම (2) රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමභාවය

(3) විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම (4) ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා කිරීම

38. පහත I තීරුවේ ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන මූලයන් ද II තීරුවේ එම ගැටුම් ඇති වූ අවස්ථා කිහිපයක් ද දැක්වේ. I හා II තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| 1. ආගමික මතවාද | A ඊශ්‍රායල, පලස්තීන ගැටුම |
| 2. දේශපාලනය | B මැදපෙරදිග අර්බුදය |
| 3. වාර්ගිකත්වය | C අයර්ලන්ත යුද්ධය |
| 4. සමාජ ආර්ථික තත්වය | D රුවන්ඩාවේ ගෝත්‍රික ගැටුම් |

(1) CADB (2) ADCB (3) DABC (4) BCDA

39. පහත A හා B ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින රටක පුරවැසියන්ට තම දක්ෂතා හා හැකියා සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා හිමි වේ.

B. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ සැමට සමාන අයිතිවාසිකම් හිමිවේ.

මෙම ප්‍රකාශ අතරින්,

(1) A හා B ප්‍රකාශ දෙකම අසත්‍යය

(2) A ප්‍රකාශයෙන් B ප්‍රකාශය පැහැදිලි කරයි

(3) A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍යය

(4) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ.

40. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් වන්නේ,

(1) අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම  (2) යහපත් පුද්ගල සබඳතා නොපැවැත්වීම

(3) අන් ආගම් හා භාෂා භාවිතයෙන් වැළකීම  (4) තම සංස්කෘතියට පමණක් ගරු කිරීම

(ලකුණු 1×40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - I, II |
|---|---|

නම / විභාග අංකය: ....................................................................................................

පුරවැසි අධ්‍යාපනය - II

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. i ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියා සතු යුතුකම් වර්ග දෙක නම් කරන්න.

ii ගැටුම් නිරාකරණය සඳහා ප්‍රගුණ කරගත යුතු පුද්ගල ගුණාංග දෙකක් ලියන්න.

iii පරිවර්තන ආර්ථිකයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

iv ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු දෙකක් සඳහන් කරන්න.

v ඕනෑම ආර්ථිකයකට මුහුණපෑමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් ලියන්න.

vi ලෝකයේ සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීමට බලපා ඇති හේතු දෙකක් සඳහන් කරන්න.

vii ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න.

viii ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ දෙකක් නම් කරන්න.

ix ගැටුම් අවම කර ගැනීම සඳහා මනසේ සාමය ඇති කර ගැනීමට යොමු විය හැකි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

x ජනතා පරමාධිපත්‍ය බලයට ඇතුළත් වන ක්ෂේත්‍ර දෙකක් ලියන්න.

(ලකුණු 2×10 = 20)

02. ''රාජ්‍යයක පාලන කටයුතු පවත්වා ගෙන යාමට එම රාජ්‍යයට ඇති හැකියාව බලය වේ.''

i ''බලය'' යන සංකල්පයේ විවිධ ස්වරූපයන්ගෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

iii (a) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල බලතල වර්ග කර ඇති ලැයිස්තු තුන නම් කරන්න.

(b) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. ''ප්‍රජාතන්ත්‍රවාදය ජනතා අදහස් නියෝජනය වන, ජනතා සහභාගිත්වය මත සිදුවන පාලන ක්‍රමයකි.''

i වර්තමානයේ ජනතා නියෝජිතයින් පත්කර ගැනීමට භාවිත කරන නියෝජන ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 02)

ii නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii (a) ප්‍රජාතන්ත්‍රවාදීය පාලනය සාර්ථක කර ගැනීමට විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් තුනක් සඳහන් කරන්න.

(b) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. ''අපගේ සියලු ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම් සංස්කෘතියට අයත් වේ.''

i ඕනෑම සංස්කෘතියකට අයත් ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීම කෙරෙහි බලපෑ සංක්‍රමණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii (a) යහපාලනයක මූලික ගුණාංග තුනක් ද,

(b) බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 05)

05. ''මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීම සඳහා සමාජයක් සංවිධානය වී ඇති ආකාරය ආර්ථික ක්‍රමයක් ලෙස හැඳින්වේ.''

i ආර්ථිකයක සිදුවන ක්‍රියාවලීන් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii ශ්‍රී ලංකාවේ දැකිය හැකි වෙළඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii (a) ලෝකයේ පවත්නා ප්‍රධාන ආර්ථික ක්‍රම තුන නම් කරන්න.

(b) ඉන් එකක දැකිය හැකි මූලික ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 05)

06. ගැටුම්කාරී තත්වයන් පුද්ගලයාට මෙන්ම සමාජයට ද හානිදායක බැවින් ආරම්භයේදීම පිළියම් යෙදීම වැදගත්ය.

i ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii ගැටුම් විසඳීම සඳහා සාකච්ඡා ක්‍රමය යොදාගත හැකි අවස්ථා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii ගැටුම් සාමකාමීව විසඳා ගැනීමෙන් අත්වන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.
ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. ''සෑම අංශයකින්ම සමාජයට හිතකර වර්ධනයක් ඇති වීම සංවර්ධනය යන්නෙන් අදහස් වේ.''

i සංවර්ධනයේදී සලකා බැලිය යුතු අංශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii වර්තමාන සංවර්ධන ක්‍රියා නිසා ශ්‍රී ලංකාවට අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

iii ගෝලීයකරණය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන,

(a) ධනාත්මක බලපෑම් තුනක් ද,

(b) ඍණාත්මක බලපෑම් දෙකක් ද ලියන්න. (ලකුණු 05)

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**වර්ෂ අවසාන පරීක්ෂණය 2021 (2022 මාර්තු)**
**පුරවැසි අධ්‍යාපනය I, II - 10 ශ්‍රේණිය**
**පිළිතුරු**

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1) - 2 | 11) - 1 | 21) - 4 | 31) - 1 |
| 2) - 1 | 12) - 2 | 22) - 1 | 32) - 2 |
| 3) - 3 | 13) - 1 | 23) - 2 | 33) - 2 |
| 4) - 2 | 14) - 3 | 24) - 3 | 34) - 4 |
| 5) - 4 | 15) - 1 | 25) - 1 | 35) - 4 |
| 6) - 4 | 16) - 2 | 26) - 4 | 36) - 1 |
| 7) - 1 | 17) - 3 | 27) - 2 | 37) - 2 |
| 8) - 4 | 18) - 3 | 28) - 4 | 38) - 1 |
| 9) - 3 | 19) - 2 | 29) - 3 | 39) - 4 |
| 10) - 3 | 20) - 4 | 30) - 1 | 40) - 1 |

(ලකුණු 1×40 = 40)

## II පත්‍රය

01. i - නීතිමය යුතුකම්
- සදාචාරාත්මක යුතුකම්

ii ආත්මාවබෝධය, ඉවසීම, සංවේදී බව, අවිහිංසක බව, මුදිතාව... ආදී

iii - පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලිකකරණය
- පෞද්ගලික ව්‍යවසාය දිරි ගැන්වීම
- ආර්ථිකය ලිහිල් කරණය,
- පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම

iv - වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම
- අධික ජනගහනයකින් යුතු වීම
- එක් ස්ථානයකට රැස්වීමේ අපහසුතා
- සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම

v - කුමක්, කොපමණ නිෂ්පාදනය කළ යුතු ද?
- කෙසේ නිපදවිය යුතු ද?
- කවුරුන් සඳහා නිපදවිය යුතු ද?

vi - ගෝලීයකරණය
- සන්නිවේදන තාක්ෂණයේ දියුණුව
- සංචාරක ව්‍යාපාරයේ දියුණුව

vii - නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර වන්නේ ව්‍යවස්ථාදායකය වීම
- බලය විමධ්‍යගත කිරීම සිදු කරයි
- රාජ්‍ය ස්වාධිපත්‍ය බලය මධ්‍යම ආණ්ඩුව වෙත ඒකරාශී වීම
- ව්‍යවස්ථාදායක විධායක අධිකරණ බලතල මධ්‍යම ආණ්ඩුව වෙත ඒකරාශී වී තිබීම

viii - එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම
- භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය අංගයන්ගෙන් යුතු වීම
- වෘත්තීය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙයවීම
- අභ්‍යන්තර හා බාහිර කටයුතු පිළිබඳ ස්වාධිපති බලය හිමිවීම

ix - ආගමික වතාවත් කෙරෙහි යොමු වීම
- මනෝ විද්‍යාත්මක අභ්‍යාස මගින්
- උපදේශනය මගින්
- ස්වාභාවික පරිසරය නිරීක්ෂණය

x - පාලන බලතල, - මූලික අයිතිවාසිකම්, - ඡන්දබලය

(ලකුණු 02×10 = 20)

02. i - දේශපාලන බලය, සමාජ බලය
- පරිපාලන බලය, - ආර්ථික බලය (ලකුණු 02)
ii - විවිධත්වය තුළ එක්සත් බව ගොඩනගා ගැනීමට
- රාජ්‍යයේ විශාලත්වය නිසා එක් මධ්‍යස්ථානයක සිට පාලනය අපහසු වීම
- ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම (ලකුණු 03)
iii - පළාත් සභා ලැයිස්තුව
- සංචෘත ලැයිස්තුව
- සමගාමී ලැයිස්තුව
(ලකුණු 03, විස්තර කිරීම ලකුණු 02)

03. i - සමානුපාතික නියෝජනය
සරල බහුතර නියෝජනය (ලකුණු 02)
ii - නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීම
- නිදහසේ මැතිවරණ කටයුතු වලට සහභාගි වීමේ අයිතිය තහවුරුව තිබීම
- මැතිවරණ නීති රීති වලට අනුකූලව මැතිවරණ පැවැත්වීම... ආදිය (ලකුණු 03)
iii - ආණ්ඩු පක්ෂය ඉටු කරන යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහාය දීම
- සංවර්ධනාත්මක විවේචන තුළින් ආණ්ඩුව සුමගට යොමු කිරීම
- ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධි ප්‍රතිපත්ති හා ක්‍රියාවන්ට විරුද්ධත්වය දැක්වීම
- වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කිරීම
(ලකුණු 03 + විස්තරයට 02 = 05)

04. i - ආගම, භාෂාව, සිරිත් විරිත්, ආචාරධර්ම, ඇදහිලි විශ්වාස... ආදී පිළිතුරු (ලකුණු 02)
ii - විජය ඇතුළු පිරිස පැමිණීම
- පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම
- භද්දකච්චානා ඇතුළු පිරිස පැමිණීම... ආදී - (10 ශ්‍රේණිය පෙළපොත, 62 පිටුව) (ලකුණු 03)
iii - දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍ය පාලනය
(a) නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම
නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම
අයිතිවාසිකම් සුරැකීම
මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම... ආදී (ලකුණු 03)
(b) ජාතික සමඟිය, සහජීවනය වර්ධනය වේ
ගැටුම් අවම වීම
අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය වීම
එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය... ආදී (ලකුණු 02)

05. i නිෂ්පාදනය
බෙදාහැරීම
පරිභෝජනය (ලකුණු 02)
ii - පෞද්ගලික අංශය දිරිගැන්වීම
- රාජ්‍ය ව්‍යවසාය කටයුතු වලින් ඈත්වීම
- රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය
- රාජ්‍ය විනිමය පාලනයෙන් ඉවත්වීම
- විදේශ වෙළඳාම සම්බන්ධ බාධා ලිහිල් වීම
- රාජ්‍ය ව්‍යවසාය දිරිගන්වන්නෙකු ලෙස ක්‍රියාකිරීම (ලකුණු 03)
iii ධනවාදී
සමාජවාදී
මිශ්‍ර (ලකුණු 03)

- **ධනවාදී**

තරඟකාරී වෙළඳපොළ, නිෂ්පාදන සාධක අයිතිය පෞද්ගලික අංශය සතුවීම
ලාභය අරමුණුකරගෙන නිෂ්පාදනය, ආදායම් අසමාන ලෙස බෙදීයාම

- **සමාජවාදී**
- දේපල අයිතිය රජය සතුවීම
- මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙයවීම
- පොදු යහපත උදෙසා කටයුතු කිරීම

- **මිශ්‍ර**
- නිෂ්පාදන සාධක රජය හා පෞද්ගලික අංශය සතුවීම
- පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයම මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමට කටයුතු කිරීම
- වෙළඳපොළ අනුව භාණ්ඩ මිළ තීරණය වුවද රජය මැදිහත්වීම (ලකුණු 02)

06. i විවිධ ප්‍රතිරූප, වෙනත් අදහස්, සීමා ඇතිවීම, අවහිරතා ඇතිවීම, මානසික තත්ත්ව, පරමාර්ථ ඉටු නොවීම (ලකුණු 02)

ii පෞද්ගලික ගැටුම්, පවුලේ ගැටුම්, දේපළ ආරවුල්, ආයතන අතර ගැටුම්, රට තුළ හා රටවල් අතර ගැටුම්, ආයතනික ගැටුම් (ලකුණු 03)

iii ජීවිත හානි වැළකීම, සම්පත් හා දේපළ හානි වැළකීම, මානසික ආතතිය අවම වීම, සාමය හා ආරක්ෂාව සුරක්ෂිත වීම... (ලකුණු 05)

07. i තිරසර සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, පුද්ගල සංවර්ධනය, සදාචාර සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය, සමාජ සංවර්ධනය (ලකුණු 02)

ii සේවා නියුක්තිය ඉහළ යාම
විදේශ විනිමය ඉපයුම් ඉහළ යාම
ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම
ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම... ආදිය (ලකුණු 03)

iii (a) **ධනාත්මක**
- විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
- ආර්ථිකය විවිධාංගිකරණය වීම
- කාර්මික හා සේවා අංශවල දියුණුව
- විවිධ කලාපීය සංවිධාන සමග එකතු විය හැකිවීම
- ගෙවුම් ශේෂය යහපත් වීම... ආදී කරුණු (ලකුණු 03)

(b) **සෘණාත්මක**
- බුද්ධිගලනය වේගවත් වීම
- සංවර්ධිත රටවලින් සිදුවන බලපෑම් ඉහළ යාම
- විදේශ ණය හා ආධාර මත යැපීමට සිදුවීම
- දේශීය සම්පත් සූරාකෑමට ලක්වීම
- දේශීය ළදරු කර්මාන්ත විනාශ වී යාම... ආදී කරුණු (ලකුණු 02)

******